සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

SLGURU.LK

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	භූගෝල විද්‍යාව	පත්‍රය வினாத்தாள் Paper	I	කාලය காலம் Time	පැය 01

සැලකිය යුතුයි:

(i) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.

(ii) සපයා ඇති උපදෙස් අනුව මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

❖ **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) පෘථිවි පද්ධතියේ උප පද්ධති අතර ජීවයක් සහිත කොටස ..... නමින් හඳුන්වයි. (ජලගෝලය, ශිලාගෝලය , ජෛවගෝලය)

(02) වායුගෝලයේ අඩංගු කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය ..... කි. (0.03 / 0.93 /20.95)

(03) මහාද්වීප අතර කුඩා ම මහාද්වීපය ..... යි. (යුරෝපා මහාද්වීපය , ඕස්ට්‍රේලියා මහාද්වීපය , ඇන්ටාක්ටික් මහාද්වීපය)

(04) ..... ලෝකයේ විශාලතම විල ය. (අයර් / සුපීරියර් / බයිකල්)

(05) ලෝම සහිත ලැටරයිට් පස, මද බෑවුම් සහිත භූමිය, ... වගාවට වඩාත් සුදුසු වේ. (තේ / රබර් / පොල්)

(06) ශ්‍රී ලංකාවේ අඩුම භූමි ප්‍රමාණයක් වී වගාවට යොදාගනු ලබන්නේ ..... දිස්ත්‍රික්කයේ ය. (මාතලේ / මහනුවර / නුවරඑළිය)

(07) ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් තුනෙන් එකක් පමණ ..... අංශයේ රැකියාවල නිරතව සිටී. (කෘෂි / කාර්මික / සේවා)

(08) ලෝකයේ වැඩි වශයෙන් ම වානේ නිෂ්පාදනය කරන රට වන්නේ ..... ය. (ඉන්දියාව / චීනය / එක්සත් රාජධානිය)

(09) කහටගහ, කොලොන්ගහ පතල් මගින් ..... ඛනිජය ලබාගනී. (මැණික් / බෝල මැටි / මිනිරන්)

(10) ආසියා මහාද්වීපික තටකය තුළ ..... දූපත පිහිටා තිබේ. (බෝර්නියෝ / තස්මේනියා / මැඩගස්කර)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

❖ **අංක 11 සිට 15 දක්වා දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් ඇඳින්න.**

(11) මහාද්වීප හා සාගර ශිලා ගෝලයෙහි පිහිටා ඇත. (නි /වැ)

(12) රදාවඩුන්න වේවැල් භාණ්ඩ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ වේ. (නි / වැ)

(13) ශ්‍රී ලංකාවේ මී ගවයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ඇති කරනු ලබන්නේ තෙත් කලාපීය ප්‍රදේශවල ය. (නි / වැ)

(14) ශ්‍රී ලංකාවට බහුලව ම බලපාන ස්වභාවික ආපදාව වන්නේ ගංවතුර ය. (නි / වැ)

(15) කපු රෙදි සඳහා සෞම්‍ය කලාපීය රටවලින් ඉහළ ඉල්ලුමක් ඇත. (නි / වැ)

❖ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීර දෙකක් දැක්වේ. ඒ අනුව "අ" සහ "ආ" තීරු ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

(16) පෘථිවි වායුගෝලයේ ප්‍රධාන ස්තර කිහිපයක් "අ" තීරුවේ ද එම ස්තරවල විශේෂ සිදුවීම් "ආ" තීරුවේ ද දැක්වේ. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

"අ"	"ආ"
1. පරිවර්තී ගෝලය	A. උන්නතාංශය සමඟ උෂ්ණත්වය සීඝ්‍රයෙන් ඉහළ යයි.
2. අපරිවර්තී ගෝලය	B. ඕසෝන් ස්තරය පිහිටා තිබේ.
3. තාප ගෝලය	C. උන්නතාංශය සමඟ උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බසී
	D. වායුගෝලයේ අඩුම උෂ්ණත්වය මෙම කොටසේ පවතී

(1) ABD (2) CBA (3) CBD (4) BCD (.....)

(17) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි භෝග කිහිපයක් "අ" තීරුවේ ද, ඒවා සම්බන්ධ පර්යේෂණායතන පිහිටි ස්ථාන "ආ" තීරුවේ ද දැක්වේ. "අ" සහ "ආ" තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

"අ"	"ආ"
1. තේ	A. මහඉලුප්පල්ලම
2. රබර්	B. තලවකැලේ
3. පොල්	C. ලුනුවිල
	D. අගලවත්ත

(1) A\DC (2) BDA (3) ABC (4) BDC (.....)

(18) ලෝකයේ ප්‍රධාන කඳුවැටි කිහිපයක් "අ" තීරුවේ ද, ඒවා පිහිටි මහාද්වීප "ආ" තීරුවේ ද දැක්වේ. "අ" සහ "ආ" තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

"අ"	"ආ"
1. ඇට්ලස්	A. එක්සත් රාජධානිය
2. රොකී	B. අප්‍රිකා මහාද්වීපය
3. මහාබාධක	C. උතුරු ඇමරිකා මහාද්වීපය
	D. ඕස්ට්‍රේලියා මහාද්වීපය

(1) BCD (2) BAD (3) ACB (4) BAD (.....)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(19) ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදන ඔස්සේ කිහිපයක් "අ" තීරුවේ ද, ඒවා අයත් රටවල් "ආ" තීරුවේ ද දැක්වේ. "අ" සහ "ආ" තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

"අ"	"ආ"
1. ඩෙට්රොයිට්	A. එක්සත් රාජධානිය
2. ඔසාකා	B. ඇමරිකා එක්සත් ජනපදය
3. ලැන්කැෂයර්	C. චීනය
	D. ජපානය

(1) BCA (2) BDA (3) ACD (4) ADB (.....)

(20) ශ්‍රී ලංකාවේ වගාකරන සුළු අපනයන බෝග කිහිපයක් "අ" තීරුවේ ද, ඒවා බහුලව වගා කෙරෙන දිස්ත්‍රික්ක "ආ" තීරුවේ ද දැක්වේ. "අ" සහ "ආ" තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

"අ"	"ආ"
1. කෝපි	A. කළුතර
2. කජු	B. කෑගල්ල
3. සාදික්කා	C. පුත්තලම
	D. මාතලේ

(1) ABC (2) BCD (3) ACD (4) BDA (.....)

❖ **අංක 21 සිට 25 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(21) සංයුතිය අනුව පාථිවි පද්ධතියේ උප පද්ධති ගණන ..... කි.


(22) කර්කටක නිවර්තනය ..... අර්ධගෝලයේ පිහිටා ඇත.

(23) තේම්ස් ගංගාව ..... ආරම්භ වන ගංගාවකි.

(24) ශ්‍රී ලංකාව ආගන්තුක සත්කාර වැනි ..... උරුම රාශියක් අත්පත් කරගත් රටකි.

(25) පරිවර්තී ගෝලයේ ඉහළ සීමාව ..... නමින් හැඳින්වේ.

❖ **අංක 26 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදාගන්න.**



(26) අම්බලන්තොට "වී" පර්යේෂණ ආයතනය පිහිටා තිබෙන දිස්ත්‍රික්කය දැක්වෙන්නේ ..... අක්ෂරයෙනි.

(27) ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් පිරිපහදු කර්මාන්ත ශාලාව පිහිටා තිබෙන සපුගස්කන්ද අයත්වන දිස්ත්‍රික්කය දැක්වෙන්නේ ..... අක්ෂරයෙනි.


(28) කෙඔලින් මැටි නිධිය පිහිටි මිටියගොඩ අයත්වන දිස්ත්‍රික්කය දැක්වෙන්නේ ..... අක්ෂරයෙනි.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

❖ **අංක 29, 30 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.**



චීනයේ විද්‍යුත් නිෂ්පාදන ආදායමෙහි වර්ධනය 2000 - 2010

(29) චීනයේ වැඩිම විද්‍යුත් නිෂ්පාදන ආදායම RMB බිලියන ..... කි.

(30) විද්‍යුත් නිෂ්පාදන ආදායම RMB බිලියන 1000ට අඩුවෙන් ලබාගත් වර්ෂය ..... වෙයි.

❖ **අංක 31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

(31) සුමාත්‍රා හා ජාවා දූපත් අයත්වන භූ තැටිය වන්නේ මින් කුමක් ද?

(1) අප්‍රිකානු තැටිය (2) පැසිෆික් තැටිය

(3) යුරේෂියානු තැටිය (4) ඉන්දු ඕස්ට්‍රේලියානු තැටිය (.....)

(32) මහාද්වීපවල විශාලත්වය අනුව දෙවන තැන ගන්නා මහාද්වීපය කුමක් ද?

(1) දකුණු ඇමරිකා මහාද්වීපය (2) ඇන්ටාක්ටික් මහාද්වීපය

(3) උතුරු ඇමරිකා මහාද්වීපය (4) අප්‍රිකා මහාද්වීපය (.....)

(33) අර්ධ වශයෙන් ගොඩබිමෙන් වටවූ මුහුදු පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

(1) කළු මුහුද, රතු මුහුද (2) කළු මුහුද , එරල් මුහුද

(3) රතු මුහුද, එරල් මුහුද (4) මධ්‍යධරණී මුහුද, එරල් මුහුද (.....)

(34) ලෝකයේ දිගම ගංගාව වන්නේ,

(1) වොල්ගා ගංගාව ය. (2) බ්‍රහ්ම පුත්‍ර ගංගාව ය.

(3) නයිල් ගංගාව ය. (4) ඔබී ගංගාව ය. (.....)

(35) උඩරට තේ වගාව සිදුකරනු ලබන්නේ,

(1) මීටර 1000 - 1500 අතර උස්බිම්වල ය. (2) මීටර 1220 ට වැඩි උස්බිම්වල ය.

(3) මීටර 610 - 1220 අතර අස්බිම්වල ය. (4) මීටර 610ට අඩු උස්බිම්වල ය. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

❖ **අංක 36 , 37 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත විචල්‍ය යුගලයන් උපයෝගී කරගන්න.**

A - අතරමැදියන්ගේ ග්‍රහණයට හසුවීම

B - දේශීය පරිභෝජනය

C - අපනයන සීමාවීම

D - ගොවියන්ගේ ආදායම

(36) එක් සාධකයක වැඩිවීම වෙනත් කරුණක් කෙරෙහි ඍජුව බලපෑමක් ඇති කරන ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර වනුයේ,

(1) B , C (2) D , A (3) C, A (4) C, D (.....)

(37) එක් සාධකයක් වෙනත් සාධකයක අඩුවීම කෙරෙහි බලපෑමක් ඇතිකරන බවට දැක්වෙන ප්‍රකාශය ඇතුළත් පිළිතුර වනුයේ,

(1) C , D (2) B, A (3) A, D (4) C, B (.....)

(38) බිහාර්, ඔරිස්සා ප්‍රාන්තවල යපස් ගල් අඟුරු පිහිටා තිබීම හා ගංගා ජලය ප්‍රයෝජනයට ගත හැකි වීම යකඩ හා වානේ කර්මාන්තය ස්ථානගත වීමට පහසුවක් වන්නේ,

(1) චීනයට ය. (2) ඉන්දියාවට ය.

(3) රුසියාවට ය. (4) එක්සත් රාජධානියට ය. (.....)

(39) ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය විසින් හඳුන්වා දී ඇති පරිදි පුරාණ නගර අයත් සංචාරක කලාපයට ඇතුළත් නගර දෙකකි.

(1) දඹුල්ල හා කුරුණෑගල (2) සීගිරිය හා නුවරඑළිය

(3) කතරගම හා අනුරාධපුරය (4) මහනුවර හා නුවරඑළිය (.....)

(40) ශ්‍රී ලංකාවේ බෝට්ටු අපනයනය කරනු ලබන රටක් වන්නේ,

(1) ජපානය (2) ආර්ජන්ටිනාව

(3) කෙන්යාව (4) නෝර්වේ (.....)

(ලකුණු 1 × 40 = 40)

SLGURU.LK
For Educational Purpose Only

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

SLGURU.LK

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	භූගෝල විද්‍යාව	පත්‍රය வினாத்தாள் Paper	II	කාලය காலம் Time	පැය 02

සැලකිය යුතුයි:

- මෙම ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් 02කි.
- I කොටස අනිවාර්ය වේ. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.

I කොටස

(01) (අ) (i) සිතියමක් යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) 1 : 50000 භූ ලක්ෂණ සිතියමක ඇතුළත් පර්යන්ත තොරතුරු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) 1 : 50000 භූ ලක්ෂණ සිතියමකින් ආවරණය වන සැබෑ භූමියේ දිග හා පළල නම් කරන්න. (ලකුණු 02)


(iv) තේමා සිතියමකින් අපට ලැබිය හැකි ප්‍රයෝජන දෙකක් දක්වන්න. (ලකුණු 02)

(v) 1 : 50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන සංස්කෘතික ලක්ෂණ උචිත වර්ණ හා සංකේත භාවිතයෙන් ඇඳ දක්වන්න.

i. ග්‍රාමසේවා කොට්ඨාස මායිම ii. පොලීසිය

iii. තේ වගාව iv. උප තැපල් කාර්යාලය (ලකුණු 02)

(ආ) පහත දැක්වෙන ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) A ,B හා C යන අක්ෂර අතුරින් පාමීර් සානුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F අක්ෂරවලින් දක්වා ඇති විල් අතරින් ටිටිකාකා විල දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H හා J අක්ෂරවලින් දැක්වෙන රටවල් තුන අතුරින් "තේ" සඳහා ප්‍රසිද්ධ කෙන්යාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K,L හා M යන අක්ෂරවලින් දැක්වෙන ගංගාවලින් මැකන්සි ගංගාව දැක්වෙන අක්ෂරය කුමක් ද?


(v) P, Q, R යන අක්ෂරවලින් දැක්වෙන දූපත් අතරින් බහමාස් දූපත් දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(ඉ) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) A, B හා C යන අක්ෂර අතුරෙන් ඉස්සන් ඇති කිරීම ව්‍යාපාරික මට්ටමින් සිදුවන හලාවත දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F යන අක්ෂර අතුරින් "වී" පර්යේෂණ ආයතනය පිහිටි බෝඹුවල දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H හා J යන අක්ෂර අතුරින් මිරිදිය මසුන් බෝකරන මධ්‍යස්ථානයක් වූ පදවිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L හා M යන අක්ෂර අතුරින් ආරුගම් බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) P, Q හා R යන අක්ෂර අතුරෙන් මාකඳුර කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටි දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

II කොටස

(02) (i) "පාෂාණවල ඝනත්වය හා සංයුතිය අනුව පෘථිවි කබොල කොටස් දෙකකට බෙදේ" ඒවා නම් කරන්න. (ලකුණු 02)

(ii) පෘථිවි කබොලෙහි විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන්වන සීමාව හඳුන්වන නම කුමක් ද?

(b) පෘථිවි කබොලේ ඇති ආර්ථික වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) ලෝක මට්ටමින් පුළුල් දේශගුණ වර්ගීකරණයක් ඉදිරිපත් කළ දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ විවිධ දේශගුණ වර්ග තීරණයවීම සඳහා බලපාන සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) නිවර්තන දේශගුණයේ විශේෂ ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

(04) (i) ආසියාවෙන් බැහැර "වී" වගා කරන ගංගා තීරුන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) "වී" වගාවට අවශ්‍ය භෞතික සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ලෝකයේ වී වගාව ආශ්‍රිතව දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) සුළු පොල් ත්‍රිකෝණය යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ පොල් වගාව ව්‍යාප්ත වීම කෙරෙහි බලපා තිබෙන සාධක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකා රජය සුළු අපනයන භෝග වගාව කෙරෙහි විශේෂ අවධානයක් යොමුකිරීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තයෙහි ප්‍රධාන අංශ දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ධීවර කර්මාන්තයේ වැදගත්කම පිළිබඳ වගන්ති තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ආශ්‍රිතව පැන නැගි තිබෙන ගැටලු තුනක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

(07) (i) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භූමි පරිභෝගය ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන වෙළඳපොළ ආශ්‍රිතව නව ප්‍රවණතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා ලැබී තිබෙන රාජ්‍ය අනුග්‍රහය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(08) (i) ජපානයේ යකඩ හා වානේ කර්මාන්තය ස්ථානගතවීමට බලපා ඇති සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජපානයේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iiii) යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ හා ප්‍රවණතා තුනක් පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(09) (i) ගෘහ කර්මාන්ත යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) ගෘහ කර්මාන්ත සංවර්ධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් දක්වන්න. (ලකුණු 03)

(iiii) ගෘහ කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති ගැටලු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

SLGURU.LK
For Educational Purpose Only

“Education is not preparation for life; education is life itself.” — John Dewey



Visit SLGURU.LK to download papers and notes.